# ඇබෑර්තු

SRI LANKA STANDARDS INSTITUTION
GUARDIAN OF QUALITY

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ (පරිපාලන) - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩය (HM 1-3)

# අධ්‍යක්ෂ (පරිපාලන) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් මානව සම්පත් කළමණාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමණාකරණය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකින් තනතුරෙහි විෂය පථයට අදාළව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ආයතනයකින් ප්‍රදානය කළ උපාධියක් ලබා තිබීම.

**සමග**

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ප්‍රදානය කළ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම (ශාස්ත්‍රපති මට්ටම) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික/වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහළවක (15) ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණාකරණ තලයේ පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

- ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
- තනතුරට අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩය යටතේ වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයක් විය යුතුය.

**වැටුප් පරිමානය**

**LKR 152,500.00 - 15 x 4,100.00 - LKR 214,000.00 (2025/03/25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වාරික 03 කින් මෙම ගෙවීම සිදුකරනු ලබයි 2025 දී LKR 113,556.00 ක් ද 2026 දී LKR 113,028.00 ක් ද 2027 දී LKR 152,500.00 ක් ද වශයෙනි.)**

**වයස**

අවුරුදු 35 කට නොඅඩු සහ 55 නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.)

**අනෙකුත් වරප්‍රසාද**

1. රාජ්‍ය සමාගම් චක්‍රලේඛ අංක PED 1/2015 හා PED 1/2015 (i) ප්‍රකාරව වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් හිමිවේ.
2. ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවනු ලැබේ.
3. ජීවිතාරක්ෂණ ආවරනය හා වෛද්‍ය රක්ෂණාවරනයක් හිමිවේ.
4. සීමාවන්ට යටත්ව බාහිර වෛද්‍ය වියදම් ගෙවනු ලැබේ.
5. මහා භාණ්ඩාගාරය විසින් අනුමත වාර්ෂික දිරිදීමනා ගෙවනු ලැබේ.
6. පිළිගත් වෘත්තියමය වටපිටාවක රැකියාව කිරීමේ අවස්ථාව.
7. වෘත්තීය දීමනාව (කළමණාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)
8. සන්නිවේදන දීමනාව.

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් අදාළ විස්තර ඇතුළත් අයදුම්පත් සහතික වල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරමින් **අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.** යන ලිපිනයට **2025 - 11 - 17** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

දුරකථන : 011 - 2671567 - 72, 011 - 2019600